සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2017 ජූලි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2017-07-15
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න අට (08) කි.

(මුළු ලකුණු 20)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.4 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 වගකීම සීමිත සමාගම් සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශන ඔබට ලබාදී ඇත:

**(a)** අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කරනු ලබන කොටස්හිමියන් මඟින් වගකීම සීමිත සමාගම් කළමනාකරණය කරනු ලබයි.

**(b)** සියලුම වගකීම සීමිත සමාගම්වලට ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා මහජනයා වෙත කොටස් නිකුත් කිරීම කළ නොහැකිය.

**(c)** වගකීම සීමිත පෞද්ගලික සමාගමකට ණය ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා මහජනයා වෙත ණයකර නිකුත් කළ හැකිය.

ඉහත ප්‍රකාශන අතුරෙන්, වගකීම සීමිත සමාගම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(b)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි. (ලකුණු 02)

**1.2** 1890 හවුල්ව්‍යාපාර ආඥා පනතෙහි විධිවිධාන සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශන සලකා බලන්න:

**(a)** සියලුම හවුල්කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක විය යුතුයි.

**(b)** දැනට සිටින සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව අලුත් හවුල්කරුවෙකු ව්‍යාපාරයට ඇතුලත් කර නොගත යුතුය.

**(c)** හවුල්ව්‍යාපාරයේ වැඩ කිරීම වෙනුවෙන් පාරිශ්‍රමිකයකට / වේතනයකට (remuneration) හවුල්කරුවෙකු හිමිකම් ලැබිය යුතුයි.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි.  (2) **(a)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි.  (4) ඉහත සඳහන් සියල්ලම.  (ලකුණු 02)

**1.3** ලාභ අරමුණු කරනොගත් සංවිධාන [Non-Profit Oriented Organizations (NPOs)] සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශන ඔබ වෙත ලබා දී ඇත:

**(a)** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මෙහෙයුම්වල ශුද්ධ මූල්‍ය ප්‍රතිඵලය, අතිරික්තය හෝ ඌනතාවය ලෙස හඳුන්වයි.

**(b)** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ප්‍රධාන අරමුණ වන්නේ එහි අතිරික්තය (surplus) වැඩිකර ගැනීමයි.

**(c)** ලාභ අරමුණු කර නොගත් සංවිධානවලට සාමාජික දායක මුදල් හැර වෙනත් ආදායම් ප්‍රභවයන් තිබිය හැක.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, ලාභ අරමුණු කර නොගත් සංවිධාන සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි.  (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(a)** පමණි.  (4) ඉහත සඳහන් සියල්ලම.  (ලකුණු 02)

**1.4** **සීමාසහිත සත් (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු අදාල වේ:

| | |
|---|---:|
| 2016 අප්‍රේල් 01 දිනට තොගය | රු.450,000 |
| 2017 මාර්තු 31 දිනට තොගය | රු.600,000 |
| වර්ෂය සඳහා ගැනුම් | රු.900,000 |
| වර්ෂය සඳහා දළ ලාභය | විකුණුම්වලින් 40% |

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම්වල වටිනාකම වන්නේ:

(1) රු.1,050,000/-.  (2) රු.1,250,000/-.  (3) රු.750,000/-.  (4) රු.1,470,000/-.
(ලකුණු 02)

*අංක **1.5** සිට **1.8** දක්වා ප්‍රශ්න වලට උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

**1.5** වත්කමක්, ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කිරීමට සපුරාලිය යුතු නිර්ණායකයන් දෙකක්(02) සඳහන් කරන්න.
(ලකුණු 02)

**1.6** **අනුරාධා** කේවලස්වාමි ව්‍යාපාරිකයෙකි. 2016 ජනවාරි 01 දිනට ඇයගේ කේවලස්වාමි ව්‍යාපාරයේ රු.2,569,400/- ක මුළු වත්කම්ද, රු.1,412,800/- ක වගකීම් ද තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ, ඇය ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනය ලෙස රු.650,000/- ක් ගෙන ආ අතර, වර්ෂයේ සෑම මාසයකදීම, ගැනිලි වශයෙන් මාසයකට රු.180,000/- බැගින් ආපසු ගෙන ඇත.

2016 දෙසැම්බර් 31 දිනට, **අනුරාධාගේ** ව්‍යාපාරයේ මුළු වත්කම් රු.2,614,100/- ක්ද, වගකීම් රු.1,369,700/- ක්ද තිබුණි.

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **අනුරාධාගේ** ව්‍යාපාරයේ ලාභය ගණනය කරන්න. (ලකුණු 03)

**1.7** **A, B** සහ **C** ලාභා'ලාභ පිළිවෙලින් 3 : 5 : 2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක යෙදී සිටියහ. **A** ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, **A** ගේ හිමිකම නිරවුල් කිරීමෙන් පසු, **B** සහ **C,** හවුල් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යෑමට තීරණය කළහ.

**B** සහ **C** අතර නව ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය ගණනය කරන්න. (ලකුණු 03)

**1.8** **සීමාසහිත සුසැන් (පෞද්ගලික) සමාගම** එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි වූ සමාගමකි. 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

<u>එකතුකළ අගය මත බදුවලට යටත්වන විකුණුම්</u>:

- මුදලට විකුණුම් - රු.100,000/- (එකතු කළ අගය මත බදු නොමැතිව).
- ණයට විකුණුම් - රු.345,000/- (එකතු කළ අගය මත බදු ඇතුලත්ව).

<u>ගැනුම්</u>:

- මුදලට ගැනුම් - රු.92,000/- (එකතු කළ අගය මත බදු ඇතුලත්ව).
- ණයට ගැනුම් - රු.230,000/- (එකතු කළ අගය මත බදු ඇතුලත්ව).

2017 ජනවාරි 01 දිනට එකතුකළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂයක් නොවීය.
*(අදාල එකතු කළ අගය මත බදු අනුපාතිකය15% කි)*

2017 මාර්තු 31 දිනට, එකතු කළ අගය මත බදු (VAT) පාලන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 04)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**පෙරේරා, සිල්වා** සහ **අයිවන්** ලාභා'ලාභ පිළිවෙලින් 5:3:2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක යෙදී සිටියහ. 2017 මාර්තු 31 දින **අයිවන්** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, **පෙරේරා** සහ **සිල්වා** ලාභා'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගැනීමට එකඟ වූහ. 2017 මාර්තු 31 දින **අයිවන්** විශ්‍රාම ගැනීමත් සමඟ, ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කළ අතර ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

| | **පිරිවැය (රු.'000)** | **2017 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය (රු.'000)** | **2017 මාර්තු 31 දිනට ප්‍රත්‍යාගණන අගය (රු.'000)** |
|---|---|---|---|
| ඉඩම | 1,000 | - | 1,500 |
| ගොඩනැගිලි | 2,000 | 600 | 1,800 |
| යන්ත්‍රෝපකරණ | 800 | 500 | 600 |
| කාර්යාල උපකරණ | 700 | 200 | 500 |

ගිණුම් පොත්වල ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණන අගයට දක්වනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ප්‍රත්‍යාගණනය සටහන් කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

2017 පෙබරවාරි 28 දිනට **සීමාසහිත සිවා (පෞද්ගලික) සමාගමේ** බැංකු සැසඳුම් ප්‍රකාශනය පහත සඳහන් පරිදි විය:

| | රු. | රු. |
|---|---|---|
| 2017 පෙබරවාරි 28 දිනට මුදල් පොතට අනුව ශේෂය | | (12,300) |
| එකතු කළා: නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්: | | |
| අංක 251371 | 12,000 | |
| අංක 251372 | 13,200 | 25,200 |
| අඩු කළා: තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| අංක 265971 | | (50,000) |
| 2017 පෙබරවාරි 28 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය (අයිරාව) | | **(37,100)** |

2017 මාර්තු මාසය සඳහා පහත සඳහන් තොරතුරු ද සපයා ඇත:

(1) 2017 මාර්තු මාසය සඳහා බැංකු ප්‍රකාශනයට අනුව, බැංකුව විසින් රු.3,000/- ක චෙක්පොත් ගාස්තුවක් අඩුකර තිබුණද, එය මුදල් පොතේ සටහන් වී නොතිබුණි.

(2) 2017 මාර්තු මාසය තුළ නිකුත් කරන ලද පහත සඳහන් චෙක්පත්, 2017 මාර්තු 31 දින වන විට ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි:

| **චෙක්පත් අංකය** | **චෙක්පතේ දිනය** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| 251433 | 2017.03.27 | 4,500 |
| 251439 | 2017.03.31 | 12,890 |

(3) 2017 මාර්තු මාසය තුළ තැන්පත් කළ පහත සඳහන් චෙක්පත, 2017 මාර්තු 31 දින වන විට උපලබ්ධි වී නොතිබුණි:

| **චෙක්පත් අංකය** | **චෙක්පතේ දිනය** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| 452316 | 2017.03.30 | 12,200 |

(4) 2017 පෙබරවාරි 28 දිනට ඇති බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ඇතුලත් කර තිබූ රු.50,000/- ක උපලබ්ධි නොවූ තැන්පතුව, 2017 මාර්තු මාසය තුළදී උපලබ්ධි වී තිබුණි.

(5) 2017 පෙබරවාරි මාසය තුළ නිකුත් කළ පහත සඳහන් චෙක්පත, 2017 මාර්තු 31 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි:

| **චෙක්පත් අංකය** | **චෙක්පතේ දිනය** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| 251372 | 2017.02.17 | 13,200 |

(6) **සීමාසහිත සිවා (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනට, මුදල් පොතේ බැංකු තීරුවේ පැවති වාසිදායක ශේෂය රු.107,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 මාර්තු 31 දිනට ගලපන ලද මුදල් පොත. (ලකුණු 01)

(b) 2017 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

2017 මාර්තු මාසය සඳහා **සීමාසහිත සිල්වර් (පෞද්ගලික) සමාගමේ** වැටුප් ලේඛනයේ (payroll) සාරාංශය පහත සඳහන් පරිදි විය:

| **මූලික වැටුප (රු.)** | **අතිකාල (රු.)** | **සේවක අර්ථසාධක අරමුදලට අඩුකිරීම් 8% බැගින් (රු.)** | **ශුද්ධ වැටුප (රු.)** |
|---|---|---|---|
| 725,000 | 91,000 | (58,000) | 758,000 |

සමාගම, මූලික වැටුපෙන්, සේවක අර්ථසාධක අරමුදලට [Employees' Provident Fund (EPF)] 12% බැගින්ද, සේවක භාරකාර අරමුදලට [Employees' Trust Fund (ETF)] 3% බැගින්ද, දායක වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු මාසය සඳහා **සීමාසහිත සිල්වර් (පෞද්ගලික) සමාගමේ,** ඉහත සඳහන් වැටුප්, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවකයන්ගේ භාරකාර අරමුදල (ETF) සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්, මුදල් ගනුදෙනුවලට අදාල සටහන්ද ඇතුළුව, **පිළියෙල කරන්න**. (ලකුණු 05)

## **05** වන ප්‍රශ්නය

**සීමාසහිත ඊගල් (පෞද්ගලික) සමාගම,** 2014 අප්‍රේල් 01 දින යන්ත්‍රයක් අත්පත් කරගත් අතර, පහත සඳහන් වියදම් දරා ඇත:

| | **රු.** |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | 1,325,000 |
| තීරු බදු හා නිෂ්කාශන වියදම් | 35,600 |
| සවිකිරීමේ පිරිවැය | 43,900 |

අත්පත් කරගත් දිනට, යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම පිළිවෙලින් වර්ෂ 10 ක් සහ රු.200,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

සමාගම, 2014 දී මුලින් මිලදීගත් යන්ත්‍රය සඳහා රු.260,400/- ක පිරිවැයකට වැඩිදියුණු කළ පැකේජයක් 2016 අප්‍රේල් 01 දින, මිලදී ගත්තේය. මෙම වැඩිදියුණු කිරීම තුළින්, යන්ත්‍රය භාවිතකොට නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ ඒකකයක නිෂ්පාදන කාලය අඩුකිරීමට මඟ පෑදී ඇත. වැඩි දියුණු කිරීම හේතුවෙන්, 2016 අප්‍රේල් 01 දිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 12 ක් බවට ඇස්තමේන්තු කර ඇති අතර අවශේෂ වටිනාකම එලෙසම පැවතුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දෑ **ගණනය කරන්න**:

(a) යන්ත්‍රයේ වැඩිදියුණු කිරීමට අදාල ගැලපීම් සටහන් කිරීමෙන් පසු, 2016 අප්‍රේල් 01 දිනට යන්ත්‍ර ගිණුමේ දැක්වෙන පිරිවැය. (ලකුණු 03)

(b) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රය වෙනුවෙන් අයකළ යුතු ක්ෂය. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

කේවලස්වාමි ව්‍යාපාරයක් වන **ෂාප්** පොත් වෙළෙඳසැලේ ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1)

| | **2017 මාර්තු 01 දිනට ශේෂය (රු.'000)** |
|---|---|
| ණයගැති පාලන ගිණුම (හර) | 2,560 |
| ණයහිමි පාලන ගිණුම (බැර) | 3,200 |

(2) 2017 මාර්තු මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවී ඇත:

| | **රු.'000** |
|---|---|
| ණයට ගැනුම් | 5,200 |
| ණයට විකුණුම් | 6,200 |
| ණයට ගැනුම් ආපසු යැවුම් | 750 |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම් | 350 |
| ණයහිමියන්ට කළ ගෙවීම් | 4,500 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 3,200 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු මාසය සඳහා පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) ණයගැති පාලන ගිණුම. (ලකුණු 02)

(b) ණයහිමි පාලන ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

කේවලස්වාමි ව්‍යාපාරයක් වන **අමාලි ට්‍රේඩර්ස්** හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ:

*(රු.'000)*

| | **2016 අප්‍රේල් 01 දිනට** | **2017 මාර්තු 31 දිනට** |
|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිල්ල (ධාරණ වටිනාකමට) | 5,000 | 4,800 |
| මෝටර් වාහන (ධාරණ වටිනාකමට) | 7,000 | 7,400 |
| තොගය | 2,500 | 2,400 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,800 | 2,700 |
| බැංකුවේ මුදල් | 1,300 | ? |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,600 | 1,350 |
| උපචිත විදුලිය | 220 | 170 |

(2) **අමාලි,** ඇයගේ ව්‍යාපාරය වන **අමාලි ට්‍රේඩර්ස්** සඳහා නිසි ලෙස ගිණුම් පොත් පවත්වා නොගනී. ඇය විසින් 2016 අප්‍රේල් 01 සිට 2017 මාර්තු 31 දක්වා ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශන විශ්ලේෂණය කර පහත සඳහන් ගනුදෙනු සාරාංශගත කරන ලදි:

| | **රු.'000** |
|---|---|
| **තැන්පතු:** | |
| මුදලට විකිණීමෙන් | 3,500 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් වලින් ලැබීම් | 2,500 |
| ණයක් ලැබීම | 1,000 |
| **චෙක්පත් වලින් ගෙවීම්:** | |
| මුදලට ගැනුම් | 1,250 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා ගෙවීම් | 1,500 |
| 2017 මාර්තු 31 දින මෝටර් රථයක් මිලදී ගැනීම | 1,000 |
| විදුලිය | 280 |
| වේතන | 1,400 |
| විවිධ වියදම් | 330 |

(3) මුදලට විකුණුම් වලින් මසකට රු.25,000/- බැගින් ගැනිලි වශයෙන් ලබාගැනීම් හැර, අනෙකුත් සියලුම මුදල් ලැබීම් **අමාලි** විසින් බැංකු ගිණුමේ තැන්පත් කරන ලදි.

(4) වාර්ෂිකව 15% ක පොලී අනුපාතිකයක් යටතේ, මාසිකව පොලී ගෙවිය යුතු රු.1,000,000/- ක බැංකු ණයක්, 2016 ජුලි 01 දින **අමාලි** විසින් ලබාගන්නා ලදී. කෙසේවුවත්, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ පොලී ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි. ණය ආපසු ගෙවීම ආරම්භ කරනු ලබන්නේ 2017 අප්‍රේල් 01 දින සිටය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනට **අමාලි ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## **08** වන ප්‍රශ්නය

**ගයේෂා** සහ **නිමේෂා, ෂා ෂා පාට්නර්ස්** හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ පිළිවෙළින් 3 : 2 අනුපාතයට බෙදාගන්නා හවුල්කරුවන් වේ. 2016 ජනවාරි 01 දින, පහත සඳහන් කොන්දේසි යටතේ **අධීෂා** හවුල්කරුවෙක් ලෙස ඇතුළත් කරගනු ලැබූවාය:

(1) පහත සඳහන් වාර්ෂික වැටුප් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි:

**ගයේෂා** : රු.360,000/-

**නිමේෂා** : රු.120,000/-

**අධීෂා** : රු.800,000/-

(2) වර්ෂයකට 5% බැගින් ප්‍රාග්ධනය මත පොලී ලැබීමට හවුල්කරුවන්, හිමිකම් ලබයි.

(3) හවුල්කරුවන් අතර ලාභා'ලාභ සමසේ බෙදාගත යුතුයි.

(4) 2016 ජනවාරි 01 දිනට හවුල්ව්‍යාපාරයේ කීර්තිනාමය රු.2,400,000/- කට අගය කළ යුතු අතර, කීර්තිනාම ගිණුමක් විවෘත නොකොට එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපිය යුතුය.

(5) 2016 දෙසැම්බර් 31 දිනට හවුල්ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2016 ජනවාරි 01 දින **අධීෂා** ගෙන ආ ප්‍රාග්ධනය | | 3,600 |
| 2016 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **ගයේෂා** | | 40,000 |
| **තිමේෂා** | | 20,000 |
| 2016 ජනවාරි 01 දිනට ජංගම ගිණුම්: | | |
| **ගයේෂා** | | 10,000 |
| **තිමේෂා** | 6,000 | |
| වර්ෂය තුළ ගැනිලි: | | |
| **ගයේෂා** | 1,500 | |
| **තිමේෂා** | 1,000 | |
| **අධීෂා** | 600 | |

(6) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු.20,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ෂා ෂා පාට්නර්ස්** හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ලාභා'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 03)

(c) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

පිහිනුම් තටාකයේ ඉදිකිරීම් නිමකිරීමෙන් පසු, 2016 ජනවාරි 01 දින **රේන්බෝ පිහිනුම් සමාජය** එහි මෙහෙයුම් ආරම්භ කරන ලදී.

එහි ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) ලැබීම් සහ ගෙවීම් ගිණුම: *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| පිහිනුම් සමාජය සඳහා පරිත්‍යාග | 10,000 | විදුලිය | 712 |
| තටාකය සඳහා දෛනික ඇතුළත්වීමේ ගාස්තු | 5,500 | ජලය | 535 |
| සාමාජික ගාස්තු | 780 | පවිත්‍ර කරන්නන්ගේ වේතන | 648 |
| පිහිනුම් ක්‍රීඩා උත්සවය සඳහා පරිත්‍යාග | 215 | පිහිනුම් තටාකය ඉදිකිරීමේ මුළු පිරිවැය | 13,200 |
| පිහිනුම් ක්‍රීඩා උත්සවය සඳහා ඇතුළත්වීමේ ගාස්තු | 75 | පිහිනුම් ක්‍රීඩා උත්සවයේ වියදම් | 92 |
| පිහිනුම් පන්ති ගාස්තු | 325 | කාර්යාල කුලිය | 240 |
| | | මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය වියදම් | 94 |
| | | පුහුණු කරන්නන්ගේ ගාස්තු | 565 |
| | | විවිධ වියදම් | 265 |
| | | 2016.12.31 දින ප/ගෙ ශේෂය | 544 |
| | **16,895** | | **16,895** |

(2) පිහිනුම් සමාජය සඳහා සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු.6,000/- කි.

(3) 2016 වර්ෂය තුළ සාමාජිකයන් 120 දෙනෙකු සමාජයට බැඳී ඇති අතර ඔවුන්ගේ සාමාජික ගාස්තු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි විය:

| | |
|---|---|
| 2016 වර්ෂය සඳහා පමණක් සාමාජික ගාස්තු ගෙවූ සාමාජිකයන් ගණන | 110 |
| 2016 සහ 2017 යන වර්ෂ දෙකම සඳහා සාමාජික ගාස්තු ගෙවූ සාමාජිකයන් ගණන | 10 |

(4) පිහිනුම් සමාජයේ කළමනාකරණය විසින් පිහිනුම් තටාකය සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත වර්ෂ 10 ක කාලයකදී ක්ෂය කිරීමට තීරණය කර ඇත.

(5) පිහිනුම් සමාජයේ සමාජිකයන් නොවන අය දෛනික ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතුය.

(6) 2016 දෙසැම්බර් 31 දිනට, පහත සඳහන් වියදම් උපචිතව තිබුණි:

| | රු. |
|---|---|
| 2016 දෙසැම්බර් මාසය සඳහා විදුලි බිල | 60,000 |
| 2016 දෙසැම්බර් මාසය සඳහා ජල බිල | 30,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

**රේන්බෝ පිහිනුම් සමාජය** සඳහා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

**සීමාසහිත සිලිකෝන් (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනට පහත ශේෂ පිරික්සුම දී ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 300,000) | | 80,000 |
| 2016 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 32,000 |
| 8% ණයකර | | 70,000 |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට): | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩම - රු. මිලියන 38) | 88,000 | |
| මෝටර් වාහන | 220,000 | |
| 2016 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 15,000 |
| මෝටර් වාහන | | 83,000 |
| 2017 මාර්තු 31 දිනට තොගය | 63,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 78,000 | |
| 2016 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 2,300 |
| බැංකු ශේෂය | | 1,000 |
| ගෙවූ ආදායම් බදු | 2,900 | |
| විකුණුම් | | 569,000 |
| විකුණුම් පිරිවැය | 363,000 | |
| බෙදාහැරීමේ වියදම් | 60,000 | |
| පරිපාලන වියදම් | 38,000 | |
| ගෙවූ ණයකර පොලී | 2,800 | |
| බැංකු අයිරාව මත පොලිය | 300 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 61,300 |
| 2016 අප්‍රේල් 01 දිනට ආදායම් බදු ප්‍රතිපාදනය | | 2,400 |
| | **916,000** | **916,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2017 මාර්තු 31 දිනට තොගය භෞතිකව සත්‍යාපනය කර පිරිවැයට අගය කර ඇත. කෙසේවෙතත්, පසුව, 2017 අප්‍රේල් 30 දින සිදුකරන ලද සමාලෝචනයේදී අනාවරණය වූයේ තොග අයිතම අතුරෙන් රු.3,000,000/- කට මිලදී ගත් අයිතම සමහරක් යල්පැන ගිය තත්ත්වයට පත්වී ඇති හෙයින් ඒවා රු.2,700,000/- කට විකුණා දැමීමට අපේක්ෂිත බවයි.

(2) සමාගමට රු.2,000,000/- ක් ගෙවීමට තිබූ එක් ගනුදෙනුකරුවෙකු, 2017 අප්‍රේල් 15 දින බුන්වත් බවට ප්‍රකාශ කරනු ලැබීම නිසා ඔහුගෙන් ලැබිය යුතු ගණන අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. තවද, වර්ෂ අවසාන ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක් ලැබිය යුතු මුදල් සඳහා දීමනාව වශයෙන් පවත්වා ගැනීමට තිරණය කරන ලදී.

(3) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි විය:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 10 |
| මෝටර් වාහන | : | වර්ෂ 5 |

(4) 2016 අප්‍රේල් 01 දින, සමාගම එකක් රු.100/- බැගින් ණයකර 700,000 ක් නිකුත්කර ඇත. වර්ෂයකට දෙවතාවක්, අප්‍රේල් 01 සහ ඔක්තෝම්බර් 01 යන දින වල, 8% බැගින් වූ පොලී ණයකර මත ගෙවිය යුතුයි. වර්ෂය තුළ ගෙවූ පොලිය, ගෙවූ ණයකර පොලී ගිණුමට හරකර ඇත.

(5) පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම් 2017 මාර්තු 31 දිනට ගිණුම්ගත කළ යුතුව ඇත:

| | **රු.** |
|---|---|
| උපචිත ප්‍රචාරණ වියදම් | 1,000,000 |
| කලින් ගෙවූ දුරකතන වියදම් | 500,000 |

(6) 2015/16 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම වන රු.2,900,000/-, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගෙවන ලද අතර, එය ගෙවූ ආදායම් බදු ගිණුමට හරකර ඇත. 2016/17 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.2,800,000/- ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලද්දේ 2017 මැයි 31 දිනය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත සිලිකොන් (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 13)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
| --- | --- | --- |
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
| --- | --- | --- |
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
| --- | --- | --- |
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |